The Journal of Studies in Humanities

Volume 4 (II) 2018

Department of Humanities, Rajarata University of Sri Lanka

# පෘතුගීසීන් යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ඉඩම් අයිතිය හා භුක්තිය

**කාන්ති ජයසිංහ**

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය, මාතර

*Email: jkajayasinghe@yahoo.com*

## Abstract

As to the Portuguese, with perhaps a few exceptions, they did not take over lands and villages previously held by Sinhalese people. Their introduction to land ownership in Ceylon came almost exclusively from the allotment of royal villages (gabadagam) and temple villages (devalagam and viharagam), and probably the main beneficiaries were those in charge of distributing lands and their protégés: the governors, the military commanders and other soldiers, the crown's local representatives, the religious orders and a few casado settlers. However, the sum total of Portuguese who took possession of Ceylonese lands must not have been more than a few hundreds. The plans to attract a mass of settlers from Portuguese descent or origins to Ceylon proved a utopia. Thus, a massive transfer of land to Portuguese hands never took place, although they would get many of the best villages in certain areas, besides enjoying some tax privileges and other benefits. Those thousands of villages that used to be held on a service tenure basis (nindagam) were kept in Sinhalese hands, even if not necessarily the same.

**Key words:-** Portuguese, land ownership, Ceylon, Sinhalese people

## හැඳින්වීම

පෙරදිග ප්‍රදේශවල ආගමික හා වෙළඳ ආධිපත්‍යය පතුරුවමින් කටයුතු කළ පෘතුගීසීහු ක්‍රි.ව.1505දී ශ්‍රී ලංකාවට පැමිණ කෝට්ටේ රාජධානිය සමග සම්බන්ධතා ගොඩනගා ගත්හ. පළමුව ලංකාවට පැමිණෙන විට මෙරට දේශපාලන බලය අත්පත් කර ගැනීමේ වුවමනාවක් ඔවුන්ට නොතිබිණි. ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීම හා වෙළඳාම ඔවුන්ගේ අරමුණ වූ අතර කෝට්ටේ රාජධානියේ බහුලව පැවති කුරුඳු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීම කෙරෙහි ඔවුන්ගේ ප්‍රධානතම අවධානය යොමු කෙරිණි. නමුත් ඒ වන විට කෝට්ටේ රාජධානියේ පැවති දේශපාලන පසුබිම ඔවුන්ට මෙරට දේශපාලන බලය

අත්පත් කර ගැනීමටද මග පෑදීය. අවිගත් වෙළඳ කණ්ඩායමක් වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීහු අවිගත් දේශපාලන කණ්ඩායමක් බවට පරිවර්තනය වූයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන බලය වෙනත් මගකට යොමු කරමින් 1597දී මුහුදුබඩ ප්‍රදේශවල බලය අත්පත් කර ගත්හ. (අබේසිංහ, 1969 : 2)

මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලය ව්‍යාප්ත කිරීමේ කාර්යයයේදී මෙරට පරිපාලන ක්‍රමයෙහි පුළුල් වෙනස්කම් ඇති කිරීමට ඔවුහු උත්සාහ නොගත්හ. මෙරට පැවති ක්‍රමානුකූල පාලන ක්‍රමය යටතේ ඔවුන්ගේ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම අපහසු නොවූ හෙයින් ඔවුහු එකී දේශීය ක්‍රමය ඔවුන්ට වඩාත් වාසිදායක ලෙස ක්‍රියාත්මක කළහ. එසේ වුවද ආගමික වශයෙන් පුළුල් වෙනසක් ඇති කිරීමට ඔවුහු මැදිහත් වූහ. ආර්ථික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සලකා බලන විට මෙරට ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු නොවූ තරම් ය. ශ්‍රී ලංකාවේ පැවති සම්පත් කොල්ලකා හැකි තරම් ලාභ ලබා ගැනීමේ සහ ආගම ප්‍රචාරය කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියා විනා මෙරට ගොවිතැන් කටයුතු හෝ වෙනත් කිසිදු යටිතල පහසුකමක් වැඩි දියුණු කිරීම කෙරෙහි ඔවුහු අවධානයක් හෝ උනන්දුවක් නොදැක් වූහ. පෙරදිගට පැමිණි දා සිට වෙළඳාම සම්බන්ධයෙන් වැදගත් වූ ප්‍රදේශ අත්පත්කොට ගැනීමට සහ ඒවා ආරක්ෂා කර ගැනීම සඳහා අධික යුධ වියදමක් දැරූ ඔවුහු ස්වකීය යටත් ප්‍රදේශවල ආර්ථික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු නොකළහ. ඒ සඳහා අවශ්‍යතාවක් හෝ ඒ සඳහා වූ ප්‍රතිපත්ති හෝ ඔවුනට නොතිබිණි. එසේ වුවද එකල ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමයෙහි යම් යම් වෙනස්කම් කිරීමට ඔවුන්ගේ පාලනය යම් තරමකට බලපා ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

ලංකාවේ පෘතුගීසි පාලනය පිළිබඳව හැදෑරීමේ දී ඔවුන් විසින් කරන ලද ඉදිකිරීම් ආගමික, සංස්කෘතික, හා ගෘහ නිර්මානය වැනි ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා ඉවහල් කර ගත හැකි වුවද ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳව හැදෑරීමට ඇති එකම මාර්ගය ලිඛිත මූලාශ්‍ර පමණි. තෝම්බු මේ සඳහා භාවිත කළ හැකි වැදගත්ම මූලාශ්‍රය වේ. ඒ අනුව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය මත මෙම පර්යේෂණය සිදුකෙරේ.

ස්වයංපෝශිත ආර්ථික රටාවට ආවේනික වන අන්දමින් ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය සකස් වී පැවතිණි. එකල පැවති ඉඩම් භුක්ති ක්‍රමය අනුව යම්යම් සේවා සැපයීම මත හෝ වෙනත් පරිත්‍යාගයක් වශයෙන් හෝ තමාට ලැබුණු ඉඩම් වගා කර තම ජීවන මාර්ගය සකසා ගැනීමට ලාංකික ගොවියාට හැකි විය. ඒ අනුව තමන්ට යැපීමට සරිලන ආකාරයේ ඉඩමක් වගා කර ගැනීම විනා එය අයිතියක් සේ ලබා ගැනීමට ඔවුහු නොපෙළඹුණහ. එසේ යමෙකු පෙළඹුණේ නම් ඒ ඉතා විරල වශයෙනි. මේ නිසා ශ්‍රී ලාංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය ගැටලුවකින් හෝ පීඩාවකින් තොරව පවත්වාගෙන යාමට රටේ ප්‍රධානියා ලෙස රජුට හැකියාව තිබිණ. මෙලෙස ශ්‍රී ලංකාවේ පැවති දේශිය පාලන ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය එකිනෙක හා දැඩි සේ බැඳී පැවතුණි. එහෙයින් නව පාලන ක්‍රමයක් සකස් කිරීමේදී ඒ හා සම්බන්ධව පැවති ඉඩම් භුක්ති ක්‍රමයද වෙනස් කිරීම අත්‍යවශ්‍ය කරුණක් විය. දේශීය රජවරුන් කිසිදු ගැටලුවකින් තොරව

පවත්වාගෙන ගිය මුත් ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය ඉතා සංකීර්ණ එකක් විය. එහෙත් එය තමන්ටද ලාභදායක ලෙස ක්‍රියාත්මක කළ හැකි බව අවබෝධ කොටගත් පෘතුගීසීහු එහි පුළුල් වෙනසක් සිදු කිරීමට පියවර නොගත්හ. ශ්‍රී ලංකාවේ නව ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා යොමුවීමට නම් සියලු ඉඩම් මැනීම කළ යුතු විය. එහෙත් යුද්ධ මාලාවක නිරත වී සිටි ඔවුන්ට මෙවැනි භාරදූර කාර්යයක් සඳහා යොමුවීම වියදම් අධික කටයුත්තක් වූ බැවින් ඔවුහු එබඳු කාර්යයකට යොමු නොවූහ.

මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසීන්ගේ පාලනයට යටත් වූ පසුව දේශීය ගොවිතැන් කටයුතු නගා සිටුවීම සඳහා කිසිදු අවධානයක් යොමු නොකළ බැවින් එම ප්‍රදේශවල කෘෂි ආර්ථිකය පරිහානියට පත්විය. පෘතුගීසීන්ගේ අවධානය යොමු නොවීම පමණක් නොව ඔවුන් පහතරට ප්‍රදේශවලදී අනුගමනය කළ පීඩාකාරී දරදඬු ප්‍රතිපත්තිය හේතු කොට ගෙන පහතරට ජනතාව ගොවිතැන් කටයුතුවලින් ඉවත්වීමද මෙම තත්වය ඇතිවීම සඳහා බලපෑ බව පැහැදිලිය. ආගමික ප්‍රචාරක කටයුතුවලදී මෙන්ම පාලන කටයුතුවලදී පීඩාවට පත් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ජනතාව ගෙන් පිරිසක් කැරලිකාරී ලෙස හැසිරුණු අතර තවත් පිරිසක් තම ගම්බිම් අතහැර පදිංචිය සඳහා උඩරට ප්‍රදේශයට ගියහ. මේ අනුව ගොවිතැන් කටයුතු අඩාළවීමෙහි ප්‍රතිඵලයක් ලෙස පෘතුගීසීන් පැමිණීමට පෙර මෙහි පැවති ස්වයංපෝෂිත ආර්ථිකය අඩපණ වූ අතර 17වන සියවස වන විට මුහුදුබඩ ප්‍රදේශවල ආහාර හිඟයක් ඇති විය. දේශීය රාජධානි පැවති සමයේ ශ්‍රී ලංකාවට සහල් ආනයනය නොකළද උද්ගත වූ තත්වය හේතුවෙන් පෘතුගීසි පාලන සමයේ සහල් ආනයනය කිරීමට සිදු විය. ඒ අනුව නූනෝ අල්වාරෙයිස් පෙරෙයිරා විසින් හාල් පාරම් 900ක් ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට එවා ඇත. (අබේසිංහ, 1969 : 100)

මෙසේ සහල් ආනයනය කිරීම අධික වියදම් දැරිය යුතු කාර්යයක් වූ බැවින් වී ගොවිතැන් කිරීම කෙරෙහි ඔවුහු අවධානය යොමු කළහ. එහෙත් ශ්‍රී ලංකාවේ ජනතාව ඔවුන් සමග අමනාපව සිටීම නිසා ගොවිතැන් කටයුතු සඳහා ශ්‍රමය සපයා ගැනීම සම්බන්ධයෙන් ගැටලු මතුවී තිබිණි. මෙයට පිළියමක් වශයෙන් ඉන්දියාවෙන් පවුල් කීපයක් ගෙන්වා මෙරට පදිංචි කරවා ගොවිතැන් කටයුතු කරගෙන යාමට පෘතුගීසීහු උත්සාහ ගත්හ. ඒ අනුව මුතුරාජවෙළ, කැලණිය හා වත්තල ප්‍රදේශවල වගා කටයුතු ආරම්භ කෙරිණි. එසේ නමුත් ඉන්දියානුවන් දිගටම ශ්‍රී ලංකාවේ රැඳෙන්නට අකමැති වූයෙන් එම උත්සාහයද අසාර්ථක විණි. (අබේසිංහ,1969 : 101)

අනතුරුව ඉන්දියාවේ ගෝව ප්‍රදේශයේ වාසය කළ කුරුම්බීන් නම් පිරිසක් ශ්‍රී ලංකාවට ගෙන්වා මුතුරාජවෙල ප්‍රදේශයේ ඉඩම් ඔවුන්ට බෙදාදීමට තීරණය කෙරිණි. මුල් අවස්ථාවේ මොවුන් සියලු බදුවලින් නිදහස් කොට පසුව සාධාරණ බිම් බද්දක් අයකිරීමටද වගා කටයුතු සඳහා අවශ්‍ය පොහොර හා ආම්පන්න නොමිලේ ලබාදීමටද තීරණය කෙරිණ. එහෙත් පෘතුගීසීන්ගේ එම යෝජනාවද ක්‍රියාත්මක කිරීමට ඔවුහු අපොහොසත් වූහ. (අබේසිංහ, 1969 : 100)

මුහුදුබඩ ප්‍රදේශවල බලය අත්පත්කර ගත් පෘතුගීසීන්ගේ ප්‍රධාන ඉලක්කයක් වූයේ ශ්‍රී ලංකාවේ ඉඩම්වලින් උපරිම ලාභ ලබා ගැනීමයි. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ ජනතාව අතර ඉඩම් බෙදා දී තිබූ ආකාරය අධ්‍යයන කළ පෘතුගීසීන්ට අවබෝධ වූ කරුණක් නම්

මෙම ක්‍රමය යටතේ ඉඩම්වලින් උපරිම ලාභ ලබා ගන්නා බවයි. දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ ඉඩම වගා කරන පුද්ගලයා තමාගේ වියහියදම් සපයා ගත්තා පමණක් නොව රජයට බදු ගෙවීම තුළින් රටට අවශ්‍ය ආදායම ලබා දීමටද කටයුතු කළේය. ඉතා සංකීර්ණ ක්‍රමයක් වුවද ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය බොහෝ ඵලදායී එකක් බව පෘතුගීසීන්ට අවබෝධ විය. ඒ අනුව ඔවුන්ටද මෙරට ඉඩම්වලින් එබඳු ලාභ ලබා ගත හැකි අන්දම පිළිබඳව සොයා බැලීමට උනන්දු වූ ඔවුහු පුද්ගලිකව මෙරට ඉඩම් අත්පත් කර ගැනීමටද උත්සාහ ගත්හ. 16වන සියවස මැද වන විට මුහුදුබඩ ප්‍රදේශවල ඉඩම් විශාල ප්‍රමාණයක් පෘතුගීසීන් විසින් අත්පත් කර ගෙන තිබිණ. මෙය කොතෙක් වැඩිවීද යත් පෘතුගීසීන් ඉඩම් අත්පත් කරගැනීම පාලනය කිරීම සඳහා රජයේ ඉඩම් තමාගේ අවසරයකින් තොරව ලබා නොගන්නා ලෙස තහනම් නියෝග පැනවීමටද බුවනෙකබාහු රජුට සිදුවී ඇත. (අබේසිංහ, 1969 : 100)

පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයේ පාලනය භාර ගැනීමත් සමග එතෙක් දේශීය රාජධානි යටතේ පැවති ඉඩම් භුක්ති ක්‍රමයේ වෙනසක් ඇති කිරීමට ඔවුහු කටයුතු කළහ. ආරම්භයේදී කෝට්ටේ රාජ්‍යයේ ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් පැවතියේ ස්වදේශිකයන් භුක්ති විඳි බඩවැඩිලි ඉඩම් ලෙසය. නමුත් එම තත්වය තුළ පෘතුගීසීන්ට ඉඩම්වලින් ලාභ ලබා ගැනීමට නොහැකි විය. ක්‍රි.ව.1597 සිදු වූ ධර්මපාල රජුගේ මරණයත් සමග කෝට්ටේ රාජ්‍යය පෘතුගීසීන් විසින් අත්පත් කර ගැනීමෙන් පසුව මෙරට ඉඩම් විශාල වශයෙන් පෘතුගීසී ජාතිකයන්ට බදු දෙන ලදී. මෙමගින් බලාපොරොත්තු වූයේ ඉඩම්වලින් බදු අයකර එමගින් ලාභ ලබා ගැනීමය. එසේ වුවත් ඉඩම්බදු වශයෙන් ප්‍රමාණවත් මුදලක් නියම කිරීමට පෘතුගීසීන් අසමත් වූයෙන් පෘතුගාල රජයට ඔවුන් බලාපොරොත්තු වූ ආකාරයේ ආදායමක් ලබා ගැනීමට නොහැකි වූ අතර ඒ හේතුවෙන් රාජ්‍ය භාණ්ඩාගාරයට අපේක්ෂිත ලාභ ලබා ගැනීමට නොහැකි විය. එබැවින් මේ ආකාරයට පෘතුගීසීන්ට ඉඩම් බෙදා දීම තහනම් කරමින් පෘතුගාල් රජු විසින් ක්‍රි.ව.1603දී නියෝගයක් නිකුත් කරන ලදී. මෙම නියෝගය තුළින් එතෙක් සිදුකොට තිබූ ඉඩම් බෙදා දීම් පවා අවලංගු විණි. (අබේසිංහ, 2005: 95)

මේ අතර ශ්‍රී ලංකාවේ ඉඩම් ක්‍රමානුකූලව පරිහරණය කිරීම සඳහා ඉඩම් සම්බන්ධ තෝම්බුවක් සකස් කිරීම කෙරෙහි පෘතුගාල් රජුගේ අවධානය යොමු විය. අරමුණු කීපයක් පදනම් කරගෙන තෝම්බු සකස් කිරීම කෙරෙහි යොමු වූ අතර තමන් අත්පත් කරගත් රාජ්‍යයේ ආදායම් පිළිබඳ තක්සේරුවක් කිරීම එක් අරමුණක් විය. මෙතෙක් ඉඩම් බදු අයකිරීම මගින් ඉටුකර ගැනීමට නොහැකිවූ ආදායම වැඩි කරගැනීමටද පෘතුගීසීහු බලාපොරොත්තු වූහ. ශ්‍රී ලංකාවේ විහාර දේවාල ඉඩම් පිළිබඳ ගැටලුවද තෝම්බු සකස් කිරීම කෙරෙහි පෘතුගීසීන් යොමු කළ තවත් හේතුවක් විය. (Pieris. 1983: 37-39) දේශීය රාජධානි සමයේ පාලකයන් විසින් බෞද්ධ වෙහෙර විහාරස්ථානවලට පවරාදී තිබූ ඉඩම් ධර්මපාල රජු විසින් ප්‍රැන්සිස්කානු පූජකයනට පවරාදී තිබිණ. එම ප්‍රදාන අනුමත කර දෙන ලෙස ඔවුහු පෘතුගාල රජුගෙන් ඉල්ලා සිටියහ. එම ඉල්ලීම සම්බන්ධයෙන් කොචින්හි පූජකවරයා සිය විරෝධය පළ කළෙන් රජුට එම කාර්යය ඉටු කළ නොහැකි විය. කෙසේ වුවද මෙම ප්‍රශ්ණය නිරාකරණය කර ගැනීම සඳහා විහාර දේවාල සම්බන්ධ තෝම්බුවක් සකස් කිරීම කෙරෙහි පෘතුගීසීන්ගේ අවධානය යොමු විය. (අබේසිංහ, 2005: 117)

ආර්ථික වාසි ලබා ගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගනු ලැබුවද 16වන සියවස අවසාන කාලය වනවිට ශ්‍රී ලංකාව වෙනුවෙන් වියදම් දැරීමට ප්‍රතිකාල් රජයට සිදුවිය. එසේ වුවත් ශ්‍රී ලංකාව එලෙස පාඩු ලබමින් පවත්වා ගෙන යායුතු රාජ්‍යයක් නොවන බවත් එහි තමන්ට උපරිම ලාභ ලැබිය හැකි තරම් සම්පත් ඇති බවත් පෘතුගාල් රජතුමා අවබෝධ කරගෙන සිටියේය. ඒ අනුව එහි නියම වටිනාකම තක්සේරු කරගැනීම තෝම්බු සකස් කිරීම කෙරෙහි පෘතුගීසීන් යොමු කළ තවත් හේතුවක් විය.

ක්‍රි.ව. 1607දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ආදායම් පාලකවරයා ලෙස සේවය කළ අන්තාවෝ වාස් පෙයිරේ වෙත ලිපියක් යොමු කළ පෘතුගාල් රජතුමා තෝම්බු සකස් කිරීම සඳහා ඔහුට උපදෙස් ලබා දුන්නේය. (Pieris, 1983 : 29) මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තෝම්බු සකස් කිරීම කෙරෙහි අන්තාවෝ වාස් පෙයිරේගේ අවධානය යොමු විය. පෘතුගීසි භාෂාවේ තෝම්බු යන පදයෙහි අර්ථය වූයේ ඉඩම් ලේඛන යන්නයි. එහෙත් මෙම ලේඛනවල ඉඩම් පිළිබඳ තොරතුරු පමණක් නොව රාජ්‍ය පාලනයේ විවිධ අංශ පිළිබඳ තොරතුරුද සඳහන් විණි. පෘතුගීසීන්ට තෝම්බු පිළිබඳ අවබෝධයක් පැවති අතර ඔවුහු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තෝම්බු සකස් කිරීමේදී දේශීය ලේකම්මිටි ඒ සඳහා ප්‍රයෝජනයට ගත්හ.

මේ අනුව මුල්කාලීන තෝම්බු බොහෝදුරට ලේකම්මිටිවල ආකෘතියට සමානත්වයක් දැරීය. රට තුළ පැවති තොරතුරු උපයෝගී කර ගනිමින් 1597දී ජෝර්ජ් ප්‍රේලින් අල්මේදා මුලින්ම තෝම්බු ලේඛනගත කළේය. පෘතුගාල් රජු විසින් අන්තාවෝ වාස් ෆෙයිරේ එම කාර්යය සඳහා පත් කළ පසු ඔහු සිය ලේකම්වරයා සමග සෑම ගමකටම ගොස් ඉඩම් අයිතිය පිළිබඳ විස්තර සියුම්ව පරීක්ෂා කොට වාර්තාගත කළේය. (Pieris, 1983 : 30) දොම් ජෙරනිමෝ බස්නායක රාල මහ මොහොට්ටියාර්, දොම් ජෙරනිමෝ සමරදිවාකර මොහොට්ටියාර්, හන්නස්රාල මොහොට්ටියාර්, දොම් ප්‍රැන්සිස්කෝ වෙල්ගාවෝ, දොම් ජෙරනිමෝ (අලගියවන්න මුකවෙට්ටි) ආදී දේශීය නිළධාරිහු කිහිප දෙනෙක් ඔහුට සහයෝගය දැක්වූහ. (Pieris, 1983 : 31) මීට පෙර දේශීය පාලකයා සතුව පැවති ඉඩම්වල අයිතිය පෘතුගීසීන් සතු කර ගැනීමත්, රජුට ගෙවූ අය බදු පෘතුගීසි පාලකයන්ට ලබා ගැනීමත්, ඒ සඳහා තමන් සතු මුහුදුබඩ ප්‍රදේශවල ආදායම නිවැරදිව තක්සේරු කර ගැනීමත් තෝම්බු සකස් කිරීමේ අරමුණ විය.

තෝම්බු සකස් කිරීමේදී ඉඩම් කට්ටි මැනීම සිදු කළ යුතු විය. මේ සඳහා වෙනම නිලධාරි පිරිසක් පත් කිරීමට පියවර ගතහොත් අධික වියදමක් දැරීමට සිදු වන බැවින් ශ්‍රී ලංකාවේ පැවති පරිපාලන ක්‍රමයම ඒ සඳහා යොදා ගැනීමට ඔවුහු තීරණය කළහ. එමෙන්ම පෘතුගීසීන්ගේ ඉඩම් ප්‍රතිපත්තිය සකස් කර ගැනීමේදී පැවති පාලන ක්‍රමය වෙනස් කිරීමේ වුවමනාවක්ද ඔවුන්ට නොදැනිණ. දේශීය පාලන ක්‍රමය යටතේ ඉඩම් භුක්තිය හා පරිපාලන ක්‍රමය එකිනෙකින් වෙන්කර ගැනීමට නොහැකි තරමින් බැඳී පැවති බැවින් එම ක්‍රමය පෘතුගීසි ඉඩම් ප්‍රතිපත්තියට කිසිසේත් බාධාවක් නො වීය. මේ වන විට ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ දිසාවේ, කෝරළේ, විදානේ යන නිලධාරීන් යටතේ ක්‍රියාත්මක විය. පෘතුගීසීන් මෙම තනතුරු එලෙසින්ම පවත්වා ගෙන ගිය අතර දිසාවේ තනතුර සඳහා එතෙක් සිටි දේශීය නිලධාරියා වෙනුවට පෘතුගීසි නිලධාරියෙක් පත් කළේය.

දේශීය පාලන ක්‍රමය යටතේ ඉඩම් ප්‍රදානය කිරීමේදී ලබාදී තිබූ සන්නස්, මෙන්ම පෘතුගීසි පාලකයන් විසින් ලබාදී තිබූ ඉඩම් ලේඛනද විහාරස්ථානවලට ලබාදී තිබූ ලේඛනද වෙන වෙනම පරික්ෂාකර බලා තෝම්බු පිළිබඳ වාර්තාව සකස් කෙරිණි. (Pieris, 1983 : 30) ඉඩම් භුක්තිය පිළිබඳ විස්තරාත්මක තොරතුරු, කුල සංවිධානය, එක් එක් ඉඩමකින් ගෙවිය යුතු බදු ප්‍රමාණය ආදිය මෙම තෝම්බු ලේඛනවල සඳහන්ව තිබිණි. තෝම්බු සකස් කරන අවස්ථාවේදීම ෆෝරාල් නම් තවත් ලේඛන විශේෂයක්ද සකස් කෙරිණි. වාර්ෂිකව රජු වෙනුවෙන් ගෙවිය යුතු සේවා බදු පිළිබඳ විස්තරයක් එහි ඇතුළත් කෙරිණි. (ද සිල්වා, 1988 : 46) 1615 වන විට ශ්‍රී ලංකාවේ තෝම්බු සකස් කොට අවසන් කළ අතර එම සකස් කළ තෝම්බු ඇසුරෙන් බදු ලේඛනයක්ද පිළියෙළ කරන ලදී. 1615දී වාස් ෆ්‍රෙයිරේ තෝම්බුව සකස් කර අවසන් වන විට එතෙක් දේශීයයන්ට හිමිව තිබූ ගම්වලින් වැඩි කොටසක් පෘතුගීසීන් අතට පත්ව තිබිණ. (අබේසිංහ, 2005 94-95) ගොවීන් විසින් අත්හැර දමා ගොස් තිබූ ගම් විශාල ප්‍රමාණයක් ඒ අතර පැවති බව තෝම්බු වාර්තාවේ සඳහන් විණි.

ඉඩම්වල අයිතිය පිළිබඳ සියලු විස්තරද, ඒවායෙහි වගා කළ දෑ පිළිබඳ විස්තරද, ඉඩම් හිමියන්ගෙන් රජුට ලැබිය යුතු සේවාවන් පිළිබඳ තොරතුරුද පෘතුගීසි තෝම්බුවේ දක්වා තිබිණි. තෝම්බුවල සඳහන් මෙම තොරතුරුද සැලකිල්ලට භාජනය කොට පෘතුගීසි පාලනයට ගැලපෙන ආකාරයේ ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය යන්න පෘතුගාල් රජුගේ නිගමනය වූ අතර ඒ සඳහා මැදිහත්වීමටද ඔහු තීරණය කළේය. පෙරදිග පෘතුගීසි පාලන මධ්‍යස්ථානය වූ ගෝව මගින් ශ්‍රී ලංකාවේ අනෙකුත් කටයුතු පාලනය කෙරෙන අතරතුර ඉඩම් භුක්තිය හා සම්බන්ධ කාර්යයන්වලදී රජු එයට සෘජුවම මැදිහත්වීමට තීරණය කිරීමෙන් පැහැදිලි වන්නේ ඉඩම්වලින් ලැබිය හැකි ආදායම පෘතුගාල රජයට ඒ තරමටම වැදගත් වූ බවයි. ඉඩම් බෙදා දීම තෝම්බු සකස් කිරීමෙන් අනතුරුව සිදු කළ යුතු බවට පෘතුගාල් රජු නියෝග කළ අතර ඉඩම් බෙදා දීමේදී ආර්ථික කරුණුවලට වඩා දේශපාලන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු බවද ඔහුගේ අදහස විය.

පෘතුගීසීන් අතර වැඩිපුර ඉඩම් ප්‍රමාණයක් බෙදා දී ඔවුන් ශ්‍රී ලංකාවේ පදිංචි කරවීමටද තීරණය කෙරිණ. (Pieris 1983: 96) පහතරට ප්‍රදේශවල පෘතුගීසි ජනගහනය වැඩි කර ගැනීම තුළින් ඔවුන් මාර්ගයෙන් වැඩි වියදමකින් තොරව උඩරට අත් පත් කර ගැනීමේ යටි අරමුණක් පෘතුගීසීන් තුළ තිබූ බව පැහැදිලි ය.

ඉඩම් බෙදා දීමේදී කතෝලික ආගමික ස්ථාන, බෞද්ධ ආගමික ස්ථාන හා කුරුඳු තලන්නන් විසූ ගම් වෙනත් අයට බෙදා දීම සිදුනොවිණි. පෘතුගීසීන් පෙරදිගට පැමිනීමේදී ඔවුන්ට වඩාත් වැදගත් භෝගය වූයේ කුරුඳුය. ඒ අනුව කුරුඳු සම්බන්ධ දෙපාර්තමේන්තුවේ වගකීම තමන් වෙත පවරා ගෙන තබා ගැනීමේ වැදගත්කම අවබෝධ කරගෙන ඒ සඳහා පෘතුගීසි නිලධාරින් පත් කර ගැනිණි. දේශීය පාලන ක්‍රමයේදී මෙන්ම ඔවුන්ට වැටුප් ලබා දීම සිදු කළේ ඉඩම් ප්‍රදානයන් මගිනි. මෙම ඉඩම් ප්‍රදාන **'ඇකමඩේසන්'** නමින් හැඳින්විණි. දේශීය රාජධානි පැවති අවධියේ රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ ගබඩාගම් පෘතුගීසි පාලනය යටතේ පවත්වා ගැනීමට තීරණය කළා පමණක් නොව ඒවා නැවත බෙදා දීමක්ද සිදු නොවිණි. නමුත් මීට පෙර බෙදා දුන් ඉඩම් ලබා දුන්නේ කෙසේද, කෙබඳු ආකාරයේ

ලියවිල්ලකින්ද යන්න තෝම්බුවේ සඳහන් කරන ලෙස ආදායම් පාලක නිලධාරියා වූ අන්තාවෝ වාස් ෆ්‍රෙයිරේට (Antao Vaz Freire) දැනුම්දී තිබිණි. (අබේසිංහ ටිකිරි , 2005: 98)

ඉඩම්වලින් බදු අය කර ගැනීම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් විය. ලබා දුන් සැම ඉඩමකින්ම බදු අය නොකළ අතර කතෝලික සභාවට ලබා දුන් ඉඩම් බිම්බදු හා සේවාවලින් නිදහස් කෙරිණි. ඉඩම් ලද අනෙක් පිරිස රජයට යම් බද්දක් ගෙවිය යුතු විය. එසේම ආසියාවේ සිටින පෘතුගීසි හමුදාවට යැවීම සඳහා සොල්දාදුවන් නඩත්තු කිරීමටද ඔවුන්ට සිදු විය. දේශීය ජනතාවට සහ පෘතුගීසීන්ට දෙයාකාරයකින් සැලකීම පෘතුගීසි පාලන කාලයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයකි. ඒ අනුව පෘතුගීසින් හා ස්වදේශිකයන් අතර ඉඩම් ලබාදීමේ ක්‍රමයේද වෙනසක් දක්නට ලැබුනි.

පෘතුගීසින්ට පවරා දුන් ඉඩම් පරම්පරා දෙක තුනක් භුක්ති විඳිය හැකි වන ආකාරයෙන් බෙදා දුන් අතර ලාංකිකයන්ට කෙටි කාලයකට පමණක් ඉඩම් ලබා දෙන ලදී. මීට පෙර බෙදා නොතිබුන ඉඩම් බෙදීමට, විකිණීමට හෝ අන් අයකුට පැවරීමට කිසිදු ඉඩම් ලාභියෙකුට පෘතුගීසීන් යටතේද අවසර නොතිබිණි. දේශීය ක්‍රමය යටතේද ශ්‍රී ලාංකිකයන්ට ඉඩම් භුක්තියේ අයිතිය රාජාභිමතයට යටත්ව හිමි වූ අතර රජුගේ අනුමැතිය ලැබෙන තෙක් කිසිදු ඉඩමකට අයිතිය පැවසීමට කිසිදු ඉඩම් හිමියෙකුට නොහැකි විය. ශ්‍රී ලංකාවේ පැවති එකී දේශීය ක්‍රමය යටතේ සිදුවූ පරිදිම මුහුදුබඩ ප්‍රදේශවල සියලු ඉඩම්වල අයිතිකරු පෘතුගාලයේ රජු බව පෙන්වීමට එරට රජුටද අවශ්‍ය වූවා යයි අනුමාන කළහැකිය. (අබේසිංහ, 2005 : 98)

රජුට අමතරව ප්‍රතිරාජ, කපිතාන් ජනරාල්වරු, හා දිසාවේවරු පෘතුගීසි පාලන ක්‍රමය යටතේ ඉඩම් බෙදා දුන්හ. මෙය ශ්‍රී ලංකාවේ එතෙක් පැවති ඉඩම් බෙදා දීමේ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමකි. පෘතුගීසීන් අනුගමනය කළ මෙම ක්‍රියා මාර්ගය හේතුවෙන් දේශීය රජු සතුව පැවති භූපති තත්වය පමණක් නොව ඒ හා බැඳුනු ගෞරවයද අත්පත් කර ගැනීමට පෘතුගාල් රජුට නොහැකි විය. මේ හේතුවෙන් රජුගේ තත්වය පහත වැටිණි. දේශීය රාජධානි පැවති අවධියේ භූපති වශයෙන් රජුට තිබූ ගෞරවය එලෙසින්ම ලබා ගැනීමට පෘතුගීසීහු බලාපොරොත්තු වූහ. (Pieris, 1909: Chapter 10) විශේෂයෙන් අසවේදු මේ තත්වය බලාපොරොත්තු විය. නමුත් ඔවුන්ගේ ක්‍රියා මාර්ග තුළින්ම ඔවුන්ට එය අහිමි විය. ශ්‍රී ලංකාවේ එතෙක් පැවති ස්ථිරසාර ඉඩම් ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට නොහැකිවීම හෝ එය නිවැරදිව අවබෝධ කර නොගැනීම හෝ එම කරුණු දෙකෙහිම බලපෑම මත ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම අඩාල විණි.

ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දුන් දා සිටම දේශීය පාලකයන් හා ඉඩම් හිමි ජන කොටස් විසින් වෙහෙර විහාරස්ථාන හා දේවාල සඳහා මහත් භක්තියකින් ඉඩම් ප්‍රදානය කරන ලදී. මේ අනුව විහාර හා දේවාලගම් වශයෙන් සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් ආගමික ස්ථානවල නඩත්තුව සඳහා වෙන් වී තිබිණි. එසේ වුවත් පෘතුගීසි පාලන සමයේ මෙම ඉඩම් වලින් කොටසක් ජනතාව අතර බෙදා දී තවත් ඉඩම් ප්‍රමාණයක් කතෝලික පූජ්‍යස්ථානවලට පවරා දෙන ලදී. පෘතුගීසීන් අනුගමනය කළ බෞද්ධ විරෝධී ආගමික ප්‍රතිපත්තිය හේතුවෙන් ඒ වන විට ඇතැම් විහාරස්ථානද ඒවායේ ඉඩකඩම් හා දේපළද භික්ෂූන් වහන්සේලා විසින් අත් හැර දමා ගොස් තිබූ හෙයින් මෙසේ ඉඩම් අහිමිවීම එම

ආයතනවලට සෘජුවම බල නොපෑවද පසුකාලීනව භික්ෂු සංස්ථාව නැවත වර්ධනය වීමේදී විහාරගම් හා දේවාලගම්වලට හිමි වූ ඉඩම් ප්‍රමාණය අඩුවීමක් දක්නට ලැබිණි.

දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේ යම් කෙනෙක් භුක්ති විඳිමින් සිටි ඉඩමක් වෙනත් අයෙකුට මාරු කිරීමක් සිදු නොවිණ. යම් අවස්ථාවක ඉඩමක් ආපසු ලබා ගනු ලැබුවේ එම පුද්ගලයා කරන ලද රාජකාරිය අහෝසිවීම (නිළපාළු) හෝ එම පුද්ගලයා මරණයට පත්වීම (මළපාළු) හෝ වෙනත් වරදකට ඉඩම රාජ සන්තක කිරීම වැනි අවස්ථාවකදී පමණි. නමුත් පෘතුගීසීන්ගේ ඉඩම් භුක්ති ක්‍රමයේ දී ඔවුන් බොහෝ අවස්ථාවල ඉඩම් රාජ සන්තක කර එම ඉඩම් වෙනත් අයෙකුට ලබාදීම සිදු විය. මෙසේ ඉඩම් පැවරීමේදී දේශීයයන්ගේ ඉඩම් පෘතුගීසීන්ට පැවරීම නිතර සිදු නොවුනද ඇතැම් අවස්ථාවල එවැනි දේ පවා සිදු වී ඇත. (අබේසිංහ, 2005 : 104) ඇතැම් අවස්ථාවල දේශපාලන හේතු පදනම් කරගෙන සහ ඉඩමේ සශ්‍රීකත්වය පදනම් කරගෙන දේශීයයන් සතු ඉඩම් පෘතුගීසීන්ට පවරා ගනු ලැබිණ. මෙම තත්වය තුළ දේශීය ඉඩම් ලැබූ සියලුම පෘතුගීසීහු සශ්‍රීක ඉඩම් හිමි පිරිසක් බවට පත්වූහ. එපරිද්දෙන් විශේෂයෙන් වෙරළබඩ තීරයේ සරුසාර පොල් ඉඩම්වල අයිතිකරුවන් බවට පෘතුගීසි ජාතිකයෝ පත්වූහ. එපමණක් නොව ඔවුන් ලැබූ ඉඩම් ප්‍රමාණයද ස්වදේශිකයන් ලැබූ ඉඩම් ප්‍රමාණයට වඩා වැඩි විය. (අබේසිංහ, 2005: 107) මෙසේ ඉඩම් අත්පත් කරගත් නිලධාරින් අතර කපිතන් ජෙනරාල්, කපිතන් මේජර්, වැනි ඉහළ නිලධාරිහුද වූහ. මීට අමතරව කොළඹ, කළුතර, ගාල්ල, මාතර වැනි මුහුදුබඩ ප්‍රදේශවල සිටි පෘතුගීසි ජාතිකයෝ එම ප්‍රදේශවල ඉඩම් වැඩි ප්‍රමාණයක් අත්පත් කර ගෙන සිටියහ. (අබේසිංහ, 2005 : 104)

පෘතුගීසි ඉඩම් භුක්ති ක්‍රමය තුළ රජයට පක්ෂපාතීව කටයුතු කළ හා කතෝලික ආගම වැළඳ ගත් පිරිසටද ඉඩම් ප්‍රදානයන් සිදු කෙරිණ. මාතර දිසාවනිය භාරව සිටි සමරකෝන් මුදලි මෙලෙස ඉඩම් ලැබූ එක් පුද්ගලයකු වූ අතර ඔහු ලස්කිරිඤ්ඤ භටයින් 12,000ක් පමණ නඩත්තු කිරි මට ප්‍රමාණවත් ධනයක් උපයාගත හැකි ඉඩම් හිමියෙකු බවට පත්වී සිටියේය. මෙසේ ඉඩම් ලැබූ තවත් පුද්ගලයන් රාශියක් පිළිබඳව තොරතුරු හමුවේ. (Pieris,1983:41) පෘතුගීසීන්ගේ මූලික අරමුණ වූ ආගම ප්‍රචාරය කිරීම හා ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම යන කරුණු දෙක මත ඉඩම් භුක්ති ක්‍රමය සකස් කර ගත් බව මෙම ඉඩම් බෙදා දීම අනුව පැහැදිලි වේ.

පෘතුගීසීන්ගේ ඉඩම් ප්‍රතිපත්තියේදී ඔවුන් අනුගමනය කළ තවත් ක්‍රියා මාර්ගයක් වූයේ ඉඩම් ලාභීන්ගෙන් බිම් බද්දක් අයකර ගැනීමයි. (Pieris,1983:42) මේ සමග තමන් ලද ඉඩම් වෙනුවෙන් රජයට සේවය කිරීම වෙනුවට මුදලින් බදු ගෙවීමට ජනතාවට හැකි විය. ගබඩාගම් බෙදා දීමේදීද පෘතුගීසී රජු බලාපොරොත්තු වූයේ රජයේ ආදායම් මාර්ග වැඩිකර ගැනීමයි. නමුත් පෘතුගීසීන්ට මෙම ක්‍රමයට වඩා ගබඩාගම්වලින් බදු ලබා ගැනීම ලාභදායී වූ බව පෙනුන බැවින් ගබඩාගම්වලින්ද බිම්බදු ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම තත්වය තුළ පැරණි ඉඩම්වලින් වැඩි කොටසක් බදු දීමට පෘතුගීසීහු පෙළඹුණහ.

එතෙක් ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය අනුව යමෙක් තමන් භුක්ති විඳින ඉඩම වෙනුවෙන් රජයට සේවය සැපයීමට මෙන්ම ලැබෙන අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන්

ගෙවීමටද බැඳී සිටියේය. එහෙත් මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලය ක්‍රියාත්මකවීමත් සමග ඉඩම් සඳහා මුදලින් බදු ගෙවීමට සිදු විය. මෙසේ ගෙවිය යුතු බදු ප්‍රමාණය තීරණය කරන ලද්දේ ඒ සඳහා පත් කළ මණ්ඩලයක් මගිනි. එවකට කපිතන් ජනරාල්වරයා වූ මනුවෙල් මස්කරෙඤ්ඤස් ඔමේම්, ආදායම් පාලක වූ වාස් ෆ්‍රෙයිරේ, හා කොළඹ කපිතන්වරයා වූ මනුවෙල් ද ඔලිවේරා ද අසවේදු යන තිදෙනාගෙන් මෙම මණ්ඩලය සමන්විත විය. (අබේසිංහ, 2005 : 112) පුද්ගලයෙකු තම ඉඩමෙන් ලබන ආදායමෙන් 12%ක් බිම් බද්ද වශයෙන් ගෙවිය යුතු විය. කිසියම් පුද්ගලයෙකු තමන්ට හිමි ඉඩම වෙනුවෙන් රජයට යම් සේවාවක් සැපයිය යුතු වුවත් සුවිශේෂ අවස්ථාවකදී එසේ සේවාව නොකොට ඒ වෙනුවට මුදල් ගෙවා එම සේවාවෙන් නිදහස්වීමේ හැකියාව දේශීය ඉඩම් භුක්ති ක්‍රමය යටතේද පැවතිණි. එසේ වුවත් එබඳු අවස්ථාවකදී රජයට සේවය කිරීමට තවත් බොහෝ පිරිසක් ඉතිරි වූහ. පෘතුගීසි පාලකයන් ආරම්භ කළ බිම් බදු ක්‍රමය යටතේ එවැනි පිරිසක් දක්නට නොවීය. එම ක්‍රමය යටතේ ඕනෑම අයෙකුට මුදලින් බදු ගෙවා සේවයෙන් නිදහස් වීමට හැකියාව තිබූ බැවින් රජයට සේවය කිරීම සඳහා සිටි පිරිස් එම කටයුතුවලින් මග හැර යාමක් දක්නට ලැබුණි. එය දේශීය ඉඩම් භුක්ති ක්‍රමය තුළ පැවති ක්‍රමානුකූල බව අවුල්කර දැමීමක් විය.

බිම් බදු අයකිරීම සම්බන්ධ රජයේ ස්ථාවරය සැම විටම එක සමාන නොවීය. ඇතැම් අවස්ථාවලදී ඉඩම් මණ්ඩලයේ කැමැත්ත අනුව එය වෙනස් කොට ඇත. විශේෂයෙන් පෘතුගීසීන්ට ඉතා වැදගත් කුළුබඩු වර්ගයක් වූ ගම්මිරිස් සම්බන්ධයෙන් මෙම තීරණය වෙනස් කෙරිණ. ඒ අනුව ගම්මිරිස් වගාකරුවන් තම බිම් බද්දෙන් 1/3ක් ගම්මිරිස්වලින්ද ඉතිරි කොටස මුදලින්ද ගෙවිය යුතු විය. (අබේසිංහ, 2005 : 113)

බිම් බදු ගෙවීමට අමතරව ඉඩමකින් සෙරපී ම් 50ක අදායමක් ලබන්නෙක් එක් හේවා භටයෙකු නඩත්තු කළ යුතු වූ අතර ඉඩමේ ආදායම සෙරපීම් 50ත් 100ත් අතර නම් ඔහුට එක් හේවාභටයෙකුට අමතරව එක් දුනුවායෙකුද නඩත්තු කිරීමට සිදු විය. ඒ ඒ අයගේ ආදායම් මට්ටම අනුව නඩත්තු කළ යුතු හේවායන්ගේ ප්‍රමාණය වෙනස් විය. පෘතුගීසි පාලකයන් ආරම්භ කළ හේවායන් නඩත්තු කිරීමේ ක්‍රමය තුළින් ඔවුන් බලාපොරොත්තු වූයේ උඩරට අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය හේවාපන්නයක් පවත්වා ගෙන යාමයි. මෙය එක් පැත්තකින් රජය නඩත්තු කිරීමේ බර ඉඩම් හිමියා පිට පැටවීමක් ලෙසද හඳුන්වා දිය හැකි අතර එමගින් දේශීය ඉඩම් භුක්ති ක්‍රමය එහෙම පිටින්ම කණ පිට පෙරළීමක්ද සිදුවිය.

පෘතුගීසීන් විසින් අයකරනු ලැබූ බිම් බදු ගෙවීම කතෝලික පූජ්‍යස්ථානවලට අදාළ නොවීය. එහෙත් බෞද්ධාගමික සිද්ධස්ථාන බදුවලින් නිදහස් කළ බවට තොරතුරු නොලැබේ. රජයට පුද්ගලිකව සේවය කළ අය සඳහා ලබා දුන් ඉඩම්ද බිම් බදු ගෙවීමෙන් නිදහස් විය. සලාගම කුලයට අයත් කුරුඳු තලන්නන් මේ අතරින් ප්‍රධාන විය. ඊට අමතරව පෘතුගීසීන්ට කුරුඳු ඇතුළු භාණ්ඩ ප්‍රවාහනය කරගැනීමට උපකාරීවූ පාරුකරුවෝද, අලි ඇතුන් ඇල්ලූ පනික්කියෝද, රජයේ ඇතුන්ට ආහාර සැපයූ පන්නයෝද, යකඩ සපයාදීමට බැඳී සිටි කුරුවිට කෝරළයේ නුගදණ්ඩ ගමේ කම්මල්කරුවෝද, රජයේ ප්‍රවාහනයට අවශ්‍ය තවලම් ගොනුන් සැපයූ මාදුරේ කෝරළේ පානගමුවේ විසූ මඩිගේ අංශයට අයත් මුස්ලිම්වරුද, කපිතන් ජනරාල්ට මාළු සැපයූවෝද බිම් බදු ගෙවීමෙන් හා හේවායන් නඩත්තු කිරීමෙන් නිදහස් වූහ. (අබේසිංහ, 2005 : 114)

## සමාලෝචනය

ඉඩම් අත්පත් කර දීමේ හා ඉඩම් බදු අයකිරීමේ යම් යම් වෙනස්කම් පෘතුගීසි පාලන සමයේ ඇති වුවද ආදායම් ඉපයීමේ ක්‍රම ඔවුන් හඳුන්වා නොදුන් බව පැහැදිලිය. දේශීය රාජධානි පැවති අවධියේ එක් එක් පුද්ගලයන් කරන ලද රාජකාරි වෙනුවෙන් ගම්බිම් හා ඉඩකඩම් ලබා දීම සිදුකළ අතර පෘතුගීසීන්ද එම ක්‍රමයම අනුගමනය කරන ලදී. පෘතුගීසීන් යටතේ සේවා ඉඩම්, සේවයෙන් නිදහස්ව අත්පත් කර ගෙන සිටි ඉඩම්, බෝග යෙන් කොටසක් ගෙවන ලද ඉඩම් යන සියල්ල අයිතිකරුවන් විසින් භුක්ති විඳිනු ලැබූ හෙයින් ඒවා කොමදිය යනුවෙන් හඳුන්වනු ලැබීය. (කොඩ්රින්ටන්, 1980 : 28) මෙම කොමදිය ඉඩම් විශාල ප්‍රමාණයක් පරවේණි ඉඩම් වශයෙන් භාවිත කොට ඇත. මේ තත්වය තුළ පෘතුගීසි නිලධාරින් වැඩි පිරිසකට විශාල වශයෙන් ඉඩකඩම් හිමිවිය. ඒ අනුව ඔවුන්ට පෘතුගාලයේදී ලැබුවාට වඩා වැඩි ආදායමක් මෙම ඉඩම්වලින් ලබා ගත හැකි විය. මෙසේ පුද්ගලිකව ඉඩම් ලැබූ ඉඩම්හිමියෝ තම ඉඩම්වලින් ලැබෙන ආදායම පිළිබඳව සැලකිලිමත් වූවා මිස අළුත් වගාවන් හඳුන්වා දීමට හෝ එමගින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට හෝ උත්සාහ නොගත්හ. මේ නිසා පැරණි ගොවිතැන් ක්‍රමයේ කිසිදු වෙනසක් පෘතුගීසි පාලන සමයේ ඇති නොවූ බව සඳහන් කළ හැකිය.

## පරිශීලිත ග්‍රන්ථ

අබේ සිංහ, ටිකිරි. (1969), **පෘතුගීසීන් හා ලංකාව 1597- 1658.** කොළඹ: ලේක් හවුස්,

අබේසිංහ, ටිකිරි. (2005.). **පරංගි කෝට්ටේ.** සීමාසහිත ස්ටැම්ෆර්ඩ්ලේක් පුද්ගලික සමාගම.

අභයවර්ධන,එච්.ඒ.පී. (2009). **ලේකම්මිටි විමර්ශනය.** කොළඹ : ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

කොඩ්රිංටන්, එච්.ඩබ්. (1980). **ශ්‍රී ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම.** කොළඹ : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ද සිල්වා, එම්.යූ. : (1988). **ශ්‍රී ලංකාවේ කුල වැඩවසම් ක්‍රමය.** කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ.

Codrinton, H.W. (1938). *Ancient Land Tenure Revenue in Ceylon,* Colombo.

Pieris P.E. (Trans). (1909). *Ribeiro, s History of Ceylon Chapter 11*. Colombo.

Pieris, P.E., 1983. *The Portuguese Era vol II* .Dehiwala: Tisara Prakasakayo.